චක්‍රලේඛ අංක: 11/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2017. 06.06

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**සමුපකාර සමිතියක් / සංගමයක් වසා දැමීමේදී ස්ථිර සේවකයින්ට වන්දි ප්‍රදානය කිරීම.**

ශීර්ෂගත කාරණය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2014-01-06 දින දරණ 02/2014 චක්‍රලේඛයෙහි, II වගන්තිය සහ VII වගන්තිය සඳහා පහත උප වගන්ති ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

**II වගන්තිය**

(අ) වන්දි මුදල් ගණනය කළ යුත්තේ වන්දි ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දිනය/ සමිතිය වසා දමන ලද දිනය/ සමිතිය ඇවර කරන දිනය යන දිනයන් අතරින් මුලින් යෙදෙන දිනයට සේවකයා ලබමින් සිටි දීමනා සහිත මූලික වැටුප පදනම් කර ගනිමිනි. මෙහි දීමනා වශයෙන් සැලකිය යුතු වන්නේ විධිමත් අනුමැතියක් සහිතව ගෙවන ලද දීමනා පමණක් වේ.

(ආ) යම් හෙයකින් සේවය අවසන් වී වර්ෂයක කාලයක් ගත වන තුරු ඉහත ප්‍රකාර වන්දි ගෙවීමට අපොහොසත් වූයේ නම්, වන්දි ගෙවන දිනය දක්වා වන කාලය සඳහා ගත වූ පූර්ණ වර්ෂ ගණනට නියමිත වැටුප් වර්ධකය උපයා ගනු ලැබූ සේ සලකා අවසන් වැටුප් පියවර තීරණය කළ යුතු වන අතර, එම කාලය ඇතුළත වැටුප් ප්‍රතිශෝධනයක් සිදු වී ඇත්නම් නව වැටුප් පරිමාණයට වැටුප් පරිවර්තනය කර වන්දි ගෙවීමට පාදක කර ගන්නා වැටුප තීරණය කර ගත යුතු වේ. එසේ තීරණය කර ගන්නා වැටුප වන්දි ගණනය කර ගැනීමේ කාර්යය සඳහා පමණක් අදාල කර ගත යුතු වන අතර, ඒ වෙනුවෙන් හිඟ වැටුප් ලබා ගත නොහැකිය.

**VII වගන්තිය**

(අ) වන්දි මුදල් ගණනය කිරීමේදී මාසක වැටුප ලෙස සැලකිය යුත්තේ, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ද ඇතුළත් ඒකාබද්ධ වැටුපය. එය සේවකයා විසින් අවසන් වරට ලබා ගත් වැටුප හෝ ඉහත II වගන්තියේ (ආ) පරිදි තීරණය කරන ලද වැටුප හෝ යන සේවකයාට වැඩි වාසිදායී වැටුප විය යුතුය.

කොමිෂන් සභා නියමය පරිදිය.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ/ගම්පහ/කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්